GMOA TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
Room No. 10, First Floor, Professional Centre,
275/75, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07.

Tel : 2580886 / 2503586
Fax : 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

06.07.2011

# පුවත්පත් නිවේදනයයි.

සිය නිර්වින්දන වෛද්‍ය හයමස් පුහුණු විම් කාලයෙන් පසු මහඔය රෝහලට වාර්තා කල යුතුව තිබු නිර්වින්දන වෛද්‍යවරිය මෙතෙක් මහඔය රෝහලට වාර්තා කර නැත. මහඔය රජයේ වෛද්‍ය නිලධාරි සංගමයේ ශාඛාව පවසන පරිදි ඇය අක්‍රමවත් ලෙස තවමත් පානදුර රෝහලට වී ගත කරන බව අනාවරණය වී ඇත. එබැවින් මහ ඔය රෝහලේ සාමාන්‍ය ශල්‍ය හා සිසේරියන් සැත්කම් ඇතුලු නාරිවේදි ශල්‍ය කටයුතු සඳහා නිර්වින්දන සේවා කාර්‍යක්ෂමව ලබා දිමට අපහසු වි ඇති බැවින් රෝගින්ගේ තත්වය අනතුරට පත් වී ඇත.

යුද්ධය පැවති කාලයේ පවා දුෂ්කර ප්‍රදේශවලට වෛද්‍යවරුන් යෙදිවීමට අවශ්‍ය සියලුම පියවරයන් වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මැදිහත් විමෙන් මනා ලෙස සිදුවිය. යුද්ධයෙන් පසු මෙම ප්‍රදේශවලට යායුතු වෛද්‍යවරුන් කොළඹ අවට ප්‍රදේශවල රඳවා තබා ගැනිමට සෞඛ්‍ය අමාත්‍යංශයේ ඉහල නිලධාරින් කටයුතු කිරීම නිවැරදි නොවන බව පෙන්වා දිමට කැමෙත්තෙමු.

කොළඹ මෙන්ම අනෙකුත් දුෂ්කර ප්‍රදේශවලට එකසේ අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබා දිමට වෛද්‍ය සංගමය වශයෙන් අප ගන්නා උත්සාහය මෙවන් අක්‍රමවත් කටයුතු නිසා අඩාල වන බව අපගේ විශ්වාසයයි.

දුෂ්කර ප්‍රදේශ වල ස්ථාන ගත වියයුතු සියලුම වෛද්‍යවරු අදාල සේවා ස්ථානවලට වහාම යොමු කල යුතු බව වෛද්‍ය නිලධාරින්ගේ සංගමය තරයේ අවධාරණය කරමු.

එසේ නොකල හොත් දුෂ්කර ප්‍රදේශවල බිඳවැටෙන සෞඛ්‍ය සේවා වල වගකිම සෞඛ්‍ය අමාත්‍යංශයේ සෞඛ්‍ය ලේකම් හා නිලධාරින් බාර ගතයුතු බව අවධාරණය කරමු.

Epitakadu

වෛද්‍ය චන්දික එපිටකඩුව

ලේකම්

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය

වැඩිදුර - වෛද්‍ය උපුල් ගුණසේකර - 0716841272

- වෛද්‍ය සංකල්ප මාරසිංහ - 0714486770